සිංහල පරිවර්තනය

# උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා තාක්ෂණවේදී සේවයට අයත් ජනපද නිලධාරී III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

උතුරු පළාත් රාජ්‍ය සේවයේ ජනපද නිලධාරී තනතුරට පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂම් සභාවේ ලේකම්වරයා විසින් පැවැත්වීම නියමිත බව නිවේදනය කර ඇත. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 07.**05.2021**දින වේ.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

*2017.01.01* වන දින සිට බලගන්වා ඇති පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද **ජනපද නිලධාරී** සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ නිර්දේශ කර ඇති කොන්දේසින්ට අනුකූලව ද, ආයතන සංග්‍රහයේ විධිවිධානයන් ද, මුදල් රෙගුලාසින් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03**වන දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයට අනුකූලවූ ආයතන කාර්ය පටිපාටි සංග්‍රහයටද යටත්ව, උක්ත තනතුර සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් එම තනතුරේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

*02.1* විවෘත තරග විභාගයෙන් සමත් වන අපේක්ෂකයන් පත්වීම් පිරිනමන දින සිට අවුරුදු තුනකට පරිවාස කාලයකට යටත්කර පත් කරනු ලැබේ. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වී ඇති පරිදි උතුරු පළාත් **ජනපද නිලධාරී** III වන ශ්‍රේණියට බඳවාගත් දින සිට අවුරුදු *03*ක කාලපරිච්ඡේදය තුළ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතුයි.

*02.2* මෙම සේවය ස්ථාන මාරුවලට යටත් වූ සේවයකි. එබැවින් මෙම නියෝගය යටතේ පත්වීම ලබා ගන්නා අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

*02.3* පත්වීම් සංඛ්‍යාව හා එය ක්‍රියාත්මක වන දිනය වැනි කරුණු යනාදිය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. නිවේදනය කරන ලද යම් පුරප්පාඩුන් හෝ පුරප්පාඩු සියල්ල සම්පූර්ණ නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතුය. පත්කිරීමට නියමිත සංඛ්‍යාව *06* කි.

## 03. වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක *03/2016* පරිදි, වැටුප් කාණ්ඩය, **MN 3 – 2016**ට අනුකූලව **ජනපද නිලධාරී** III වන ශ්‍රේණියට අයත් ඒකාබද්ධ වැටුප වතුයේ රුපියල් **31, 040 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57, 550/-කි.** (රුපියල් 31,930 ක් වන වැටුප් පියවරට එළඹීමට ප්‍රථමයෙන් පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුයි)

## 04. සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුයි.

04.2 අයදුම්කරුවන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි ශාරීරික යෝග්‍යතාවයකින් සිටිය යුතුයි එමෙන්ම මනා චරිත.වත් පුද්ගලයකු ද විය යුතුයි.

04.3 අ) අයදුම්කරුවන් උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙරාතුව එළෙඹෙන වසර හයක(06) කාලපරිච්ඡේදය තුළ අවම වශයෙන් වසර තනක් (03) හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි.

**හෝ**

ආ) අයදුම්කරුවන්ගේ හෝ දෙමාපියන්ගේ උපන් ස්ථානය උතුරු පළාත විය යුතු අතර අවම වශයෙන් අවුරුදු පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි **(සම්මුඛ පරීක්ෂණයේ දී ස්ථිර පදිංචි සනාථ කිරීමට ඡන්දහිමි නාම ලේඛනයේ උපුටනයක් ඉදිරිපත් කළ යුතුයි)**

04.4 අයදුම්පත්‍රය භාරගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවා ඇති **සුදුසුකම් සියල්ල** අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-

**අ) අධයාපන සුදුසුකම් :-**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් එකවර භාෂාව (දෙමළ/සිංහල/ඉංග්‍රීසි) ගණිතය හා විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සමග විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුයි.

**ඒ සමග**

අ.පො.ස (උ/පෙ) විභාගයෙන් විද්‍යා විෂය ක්ෂේත්‍රයෙන් සාමාන්‍ය පරීක්ෂණය හැර එකවර විෂයයන් තුනකට (03) සාමාර්ථයක් ලබා තිබිය යුතුයි

**ඒ සමග**

ආ) වෘත්තිය සුදුසුකම් :-

කුණ්ඩසාලෙයි වවුනියාව අම්පාර හාර්ඩි උසස් තාක්ෂණ විද්‍යාලයෙන් ලබා ගත් වසර දෙකකට (02) නොඅඩු කෘෂිකර්ම ඩිප්ලෝමා හෝ ඊට සමාන වූ ඩිප්ලෝමා සුදුසුකමක් ලබා තිබිය යුතුයි.

**හෝ**

තෘතියික වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් හෝ අනුමත කරන ලද වෙනත් ආයතනයකින් අදාල ක්ෂේත්‍රයට සම්බන්ධ ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම - 06 (N.V.Q Level - 06) අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබිය යුතුයි.

ඇ) වයස් සීමාව :-

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස **අවුරුදු 18 කට නොඅඩු, අවුරුදු 30**ට නොවැඩි විය යුතුයි, පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

## 06. බඳවා ගන්නා ක්‍රමය

06.1 ලිඛිත විභාගයෙන් හා නිපුණතාවය පදනම් කරගෙන, බඳවා ගන්නා අවස්ථාවේදී බලගන්වා ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටීන්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදීන්ට අනුකූලව බඳවා ගනු ලැබේ. මෙම නිවේදනය මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරන අතර ඒ සඳහා ලකුණු පිරිනමන්නේ නැති අතර සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය සුදුසුකම් නැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා ඇති අයිතිවාසිකම් සියල්ල අහෝසි කරනු ලැ

*06.2* ඉහත පරිදි සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන්, ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන අපෙක්ෂකයන් ලබාගන්නා සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් ඉහළම ලකුණු අනුපිළිවෙල අනුව පත්වීමට තෝරාපත් කරනු ලැබේ.

*06.3* පුරප්පාඩු වලින් *03%* ක් ආබාධිතයන් වෙනුවෙන් වෙන් කරනු ලැබේ. අපෙක්ෂකයන් පත්වීම සඳහා තෝරා ගනු ලබන විට අදාල තනතුරේ සේවය කිරීමට තම ආබාධිත තත්වය බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණය මගින් සනාථ කළ යුතුයි.

## 07. විභාග ගාස්තුව :-

අයදුම්කරුවන් පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක රුපියල් ***500.00*** ක් වටිනා මුදලක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ තැන්පත් ගිණුම් අංකය වන ***"3401"*** ට ගෙවා මුදල් ගෙවූ කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නොගැලවෙන පරිදි අදාල කොටුවේ අලවා යොමු කළ යුතුයි. කුමණ හේතුවක් නිසා හෝ මෙම ගාස්තුව නැවත ගෙවනු නොලැබේ. එමෙන් ම මෙම ගාස්තුව වෙනත් කිසිදු විභාගයක් සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කරන ක්‍රමය:-

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයෙන් යුත් (සෙ.මී*21*.x සෙ.මී *29*) කඩදාසියේ *1* සිට 10 දක්වා වූ ජේද පළමු කොටසේ ද, 11 සිට 15 දක්වා වූ ජේද දෙවන පිටුවේ ද, ඉතිරි කොටස් අනෙක් පිටුවටද ඇතුලත් වන පරිදි අයදුම්පත් සකස් කර ගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **07.05.2021**වන දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුයි.

08.2 අයදුම්පත්‍රය යොමු කරන ලිපි කවරයේ වම් උඩ කෙළවරේ **"ජනපද නිලධාරි III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - *2021*"** යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*08.3* අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් තම භාරයේ තබා ගැනීමට ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හෝ පූර්ව නිශ්චිත පිටපත් භාර ගනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. **විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරුවන් සියලුම සුදුසුකම් සපුරා ඇති බවට අදහස් කිරමක් නොවන බව සැලකිය යුතුයි.**

08.4 අයදුම්පත්‍ර යොමු කර ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් අනතුරුව පුවත්පත් නිවේදනයක් මගින් දැනුම් දෙනු ලැබේ. නිවේදන නිකුත් වී අවම වශයෙන් දින තුනකට (03) කට පෙරාතුව හෝ කිසියම් අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශපත්‍ර නොලැබුණේ නම් පහත සඳහන් තොරතුරු සමග, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකථන අංකය -021 221 9939, ෆැක්ස් අංකය -021 221 9940)

**සම්බන්ධ වන විට ඉදිරිපත් කළ යුතු තොරතුරු :-**

විස්තර සඳහන් ලිපියක්, අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීමට අවශ්‍ය ෆැක්ස් අංකයක්.

08.6 විභාගයට අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. එමෙන්ම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ප්‍රථම සියළුම සුදුසුකම් සපුරා නැති අයදුම්පත්‍ර පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇති අතර ඒ බවට කිසිදු නිවේදනයක් නිකුත් කරනු නොලැබේ.

## 09. අනන්‍යතාවය සනාථ කිරීම :-

අපේක්ෂකයන් තමන් පෙනී සිටින සියළුම විෂයයන් සඳහා විභාග ශාලා අධීක්ෂණ නිලධාරි තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය සනාථ කළ යුතුයි. අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එකක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ගුවන් බලපත්‍රය.
(iii) වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ විභාගයට පෙනී සිටින විට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ අභිමතය පරිදි ප්‍රතික්ෂේප කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතීන්ට අනුකූලව කටයුතු කිරීමට නැඹුරුවිය යුතුය.

## 10. සාවද්‍ය තොරතුරු සඳහා දඬුවම් :-

අයදුම්පත්‍ර සම්පූර්ණ කරන විට අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු සැපයීමට වගබලා ගත යුතුයි. මෙම විභාග රීතීන්ට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථමයෙන් හෝ විභාගයට පසුව හෝ කුමණ හෝ අවස්ථාවකදී හෝ සුදුසුකම් සපුරා නැති බවට අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය සඳහා ඇති හිමිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. එමෙන් ම අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද කිසියම් තොරතුරක් සාවද්‍ය තොරතුරු බව අනාවරණ වන කුමණ අවස්ථාවකදී හෝ පළාත් රාජ්‍ය සේවයෙන් නෙරපා හැරීමට අවස්ථාව ඇත.

## 11. අත්සන සහතික කිරීම් :-

**සෑම අයදුම්කරුවෙකු විසින් ම තම අත්සන සහතික කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.** එක් රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අයදුම්කරුවෙකු වේ නම් තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් විසින් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, සාම විනිසුරු, දිවුරුම් ප්‍රකාශක නිලධාරි, නීතිඥ, නොතාරිස්වරයෙකු, නාවික හමුදාව, යුදහමුදාව, ගුවන් හමුදාව යනාදියෙහි අණ ලැබූ නිලධාරියෙකු, රුපියල් 498,960.00 ට නොඅඩු වටිනාකමක් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් වශයෙන් ලබන්නා වූ ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධාරියෙකු, ආගමික නිකායන් භාර ආගමික නායකයන් වැනි අයගෙන් කෙනෙකු සහතික කළ යුතුයි.

## 12. විභාග සැළැස්ම :-

මෙම විභාගය සඳහා පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. දෙමළ මාධ්‍යයෙන් පැවැත්වීමට නියමිත මෙම විභාගයට සුදුසුකම් සපුරා ඇති සිංහල භාෂා මාධ්‍යය මගින් ද අයදුම්පත්‍ර යොමු වන විට මෙම විභාගය සිංහල මාධ්‍යයෙන් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. අයදුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. විෂය මාලාව පහත සඳහන් පරිදි වේ :-

| අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය මාලාව | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01. | අභියෝග්‍යතාවය | මෙම ප්‍රශ්න පත්‍රයට සංඛ්‍යාත්මක, තර්කානුකූල සාධාරණත්වය හා තීක්ෂණ බුද්ධිය යනාදි කරුණු කෙරෙහි අයදුම්කරුවන්ගේ දැනුම පරික්ෂා කිරීමට සකස් වෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. | පැය *01* | 100 |
| 02. | සාමාන්‍ය දැනුම | මෙම ප්‍රශ්න පත්‍රයට සමකාලීන විෂයයන් හා මෙම තනතුර සමග අදාල වන කෘෂි ක්ෂේත්‍රය පිළිබඳ අයදුම්කරුගේ දැනුම පරික්ෂා කිරීම සඳහා පදනම් වූ ප්‍රශ්නවලින් සමන්විත වේ. | පැය *01* | 100 |

මෙම විභාගය තරග විභාගයක් වන බැවින් පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට සෑම විභාග අපේක්ෂකයෙකුම එක් එක් විෂයයන් සඳහා වෙන් කරන ලද ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලික ප්‍රතිශතයක් (40%) හෝ ලකුණු ලබා ගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේදී මෙම තරග විභාගයෙන් අයදුම්කරුවන් ලබාගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ ඉහළ ලකුණු අනුපිළිවෙළ (Merit Order) සැළකිල්ලට ගනු ලැබේ.

13. විභාග අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවයේ ලේකම්වරයා විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර් ජාලය මගින් නිකුත් කරනු ලැබේ. ඉන් අනතුරුව විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් හට තැපැල් මගින් ප්‍රතිඵල යොමු කරනු ලැබේ.

14. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් සම්බන්ධයෙන් වූ බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා සතුය. මෙම නිවේදනය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් මගින් පළ කරන අතර භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවක් වෙතොත් එම අවස්ථාවේදී දෙමළ මාධ්‍යයේ නිවේදනය පරිදි කටයුතු කළ යුතුයි.

15. උක්ත විභාගය සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් ලබා ගත හැකියි.

**S. තිරුවාකරන්.**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
*12.04.2021*